# කතාබහ

ජගත් ජේ එදිරිසිංහ

## තාත්තලා



ලංකාවෙ රූපවාහිනී වල ලස්සන වෙළඳ දැන්වීමක් යනවා.

ගෘහනිර්මාණ ශිල්පියකු වන තාත්තා නිවසක සැළැස්මක් අඳිමින් ඉන්නවා. හුරතල් පුංචි දුව එතැනට එනවා. ඇවිත් මෙහෙම කියනවා.

"ඔය ගෙදර නං මේ වගේ කාමරයක් හදන්න එපා.. එතකොට ඒ තාත්තත් දුව එක්ක කතා කරන්නෙ නැතුව මේ වගේ වැඩ කර කර ඉඳියි.."

දුවගෙ හුරතල් කතාවට තාත්තට දුක හිතෙනවා. තාත්ත කරමින් හිටිය වැඩේ නවත්තලා දුව එක්ක සෙල්ලම් කරන්න යනවා..

දැන්වීම හරිම ලස්සනයි. නිමාවත් ඉතාමත්ම කලාත්මකයි. චූටි දුවත් මලක් වගේ හුරුබුහුටියි. ඒත් මේ දැන්වීමෙන් දෙන පනිවුඩය ගැන නම් දෙපාරක් හිතන්න වෙනවා.

තාත්තා දිවා රෑ නොබලා දුක් මහන්සි වෙලා වැඩ කරන්නෙ දුවගෙ අනාගතය සරු කරන්න නේද කියන දේ කාටවත් නොහිතුණේ ඇයි?

මට මතක් වෙන්නෙ අපේ තාත්තා. අපේ යුගයේ කොයි තාත්තත් වගේ ඔහු අපව හුරතල් කළේ නැහැ. ඒ වෙනුවට ඔහු ඉතාම දුක් මහන්සි වෙලා අපේ අනාගතය වෙනුවෙන් බොහෝ දේ කළා. අදත් අපි කෙළින් ඉන්නෙ තාත්තා හදා දුන් පදනම මතයි. අපේ තාත්තත් තමන්ගෙ වැඩ රාජකාරි අතපසු කරගෙන අපව හුරතල් කර කර හිටියා නම් අපට අද මොනවා වෙලා තියේවිද මන්දා.

වරදවා වටහා ගන්න එපා. මං කියන්නෙ දරුවන් සුරතල් කරන්න එපා කියලා නෙවෙයි.

## ලෝකය වෙනස් වෙලා



අපි පුංචි කාලෙ අපේ වැඩිහිටියන් අපට කොයි තරම් ආදරය පෙන්නලා තියෙනවාද? සමහර විට අපව වඩා ගන්නවා. කැමති කැවිලි පෙවිලි අරගෙන දෙනවා. ආදරයෙන් සිප ගන්නවා. තුරුළු කරගෙන ඉන්නවා. ඒ කිසිම දේක නරකක් තිබුණෙ නැහැ. ආදරය පමණමයි. මේ වැඩිහිටියන් අපට පෙන්වූ සෙනෙහස නිසා ඇති වුණ ගෞරවය අදත් අපේ හිත් වල තියෙනවා.

ඒත් දෙයියනේ දැන්  මේ මොකක්ද වෙලා තියෙන්නෙ? ඔබට දැන් කාලයේ ඔබේ නොවන කුඩා දරුවකුට ඒ වගේ ආදරයක් පෙන්නන්න පුලුවන්ද? සුරතල් කරන්න පුලුවන්ද. කළොත් මළා තමයි. ළමා අපයෝජකයෙක් කියලා හිරේත් යන්න වෙනවා. ළමා අපයෝජනයත් සෙනෙහසත් අතර කොයි තරම් වෙනසක් තියෙනවද? ඉතාම අතළොස්සක් වන ළමා අපයෝජකයන් නිසා සමාජයේ මානුෂික බැඳීම් එහෙම පිටින්ම උඩු යටිකුරු වෙලා.

දැන් හැම තැනදිම අපට උපදෙස් ලැබෙන්නෙ ඈදරය පෙන්වනවා තියා දරුවෙකුගෙ අතින් වත් අල්ලන්න එපා කියලයි. ලෝකය වෙනස් වෙලා තියෙන තරම්.

## සොරි අනේ..



පහුගිය දාක වැඩකට බටහිර මෙල්බන් ප්‍රදේශයට ගිය වෙලාවක ඒ පැත්තෙ ශ්‍රී ලාංකික වෙළඳ සළකට ගොඩ වුණා අවශ්‍ය බඩු ටිකක් ගන්න. මම වෙළඳ සලේ අයිතිකාර මහත්මයා සමග කතා කරමින් සිටියදි අම්ම කෙනෙකුයි වයස තුනක විතර පුතෙකුයි කඩේට ආවා.

අම්මා බලාගෙන ඉන්දැද්දිම අර පුංචි පැටියා විකුණන්න රාක්කෙක තිබුණ ලොකු මුට්ටියක් උස්සලා ගත්තා. දඩස්.. මුට්ටිය බිම වැටුණා.. කුඩේ කුඩු.

"අයියෝ බලන්න පුතා ඔයා කළ නෝටි වැඩේ..." අම්ම දරුවා හුරතල් කළා. වඩා ගත්තා. මුදලාලි දිහා බැලුවා. "සොරි අනේ.." කිව්වා. යන්න ගියා..

මුදලාලියි මමයි මූණෙන් මූණ බලා ගත්තා.

"ඔහොම තමයි වැඩ. කඩවලට ගොඩවෙන දරුවන් අතින් කැඩෙන බිඳෙන ඒවට කම්පා වෙලා මුදල් ගෙවලා යන්නෙ බොහොම ටික දෙනයි. සමහරු තමන්ගෙ දරුවා අතින් යමක් කැඩුණා බිඳුණා කියලවත් දන්නෙ නැහැ.. පුංචි එකෙක් අතින් කැඩුණා නිසා අපි හුඟක් වෙලාවට අහිතක් නැතුව පාඩුව දරා ගන්නවා. ඒත් බලන්නකො මේ මනුස්සයා කළ දේ.. මට දුක කොස්සක් අරගෙන මේ සුන් බුන් ටික වත් අස්කරලා නොගිය එකට.." මුදලාලි කිව්වෙ සුසුමක් හෙළමින්.

## හැඳි නොගා හදන හෝදි



වරදක් කළ තමාගෙ දරුවාට පහරක් ගැසූ අම්මා කෙනෙකුව පොලිසියෙන් අල්ලගෙන ගිහිල්ලා උසාවියට දාලා. මේක වුණේ ක්වින්ස්ලන්ත ප්‍රාන්තයේ.

දරුවකුගේ වරදකට දඬුවමක් දීම උසාවි ගෙන යා යුතු වරදක්ද? මේ ප්‍රශ්නය ඇහුවෙ එක්තරා රූපවාහිණී නාළිකාවකින්. බහුතරයකගෙ මතය වුණේ පොලිසිය සීමාව ඉක්මවා යන වැඩක් කරලා යන්නයි. මානව අයිතිවාසිකම් සංවිධානයක කෙනෙක් නම් කිව්වෙ දරුවෙකු ට දඬුවම් දෙන්න දෙමාපියන් ටවත් අයිතියක් නැහැ කියලයි.

අපි පුංචි කාලෙ නම් ඇහුවෙ හැඳි නොගා හදන හොද්දයි දඬුවම් නොදී හදන දරුවයි දෙකම එකයි කියලයි. දෙකේම ගන්න දෙයක් ඉතුරුවෙන්නෙ නැහැ.

අපි දඬුවම් විඳලා හැදිච්ච පරම්පරාවක ළමයි. ඒ දඬුවම් වලින් අපට හොඳක් මිසක් නරකක් වුණේ නැහැ නේද කියන එක දැන් අපට තේරෙනවා. ඒත් දැන් සමාජය වෙනස් වෙලා. දැන් ඉන්නෙ දෙමාපියන්ට බය දරුවෝ නෙවෙයි. දරුවන්ට බය දෙමාපියන්. ඉතින් කොහොමද දරුවෝ හැදෙන්නෙ.

මේ ප්‍රශ්නය වඩාත් සංකීර්ණ එකක් වෙන්නෙ සමහර දෙමාපියන් තමන්ගෙ කෝපය පිටකරගන්න දරුවන්ට පහර දෙන්න යන නිසයි.  ඒ වගේ වෙලාවට අසරණ දරුවා පත්වෙන්නෙ ඉතාම අසාධාරණ තත්වයකටයි. දරුවන්ට දඬුවම් දීම තහනම් කළ යුතුයයි කියන සංවිධාන ප්‍රධාන වශයෙන් පෙන්වා දෙන කාරණයක් තමයි ඒක.  ඒ කාරණයේ විශාල ඇත්තක් තියෙනවා.  කිසිම අවස්ථාවක දරුවකුට කෝපයෙන් දඬුවම් ලබා දිය යුතු නැහැ.

2007 දී සම්මත කළ පනතකින් දරුවන්ට දඬුවමක් ලෙස පහරක් දීම නවසීලන්තයේ තහනම් කෙරුණා. මේ තහනම නිවැරදිදැයි පසුගිය දා එරටේ දී කළ සමීක්ෂණයකදී 85% කීවේ දරුවන්ට දඬුවමක් දීමට දෙමාපියන්ට අයිතියක් ඇති බවයි. ඒත් ඔස්ට්‍රේලියාවේ නම් තවම එහෙම තහනමක් නැහැ.

පසු සටහන - විරුද්ධ පක්ෂ නායක බිල් ෂෝට්න් එවන් තහනමක් ඉල්ලා පුද්ගලලික පනතක් ඉදිරිපත් කරන්නට යන බව මේ සටහන ලියද්දි දැනගත්තා.

16 වන පිටෙන්

''මොකද ළමයො?''

මම බඩ අල්ලාගෙන තදින් කෙඳිරි ගෑවෙමි. දෙපසින් අල්ලා ගත් දෙදෙනෙක් මා තඩලාගෙන මෙන් ගුරුතුමිය අසලට ගෙන ගියහ. මුළු පන්තියේ පමණක් නොව අසල පන්තිවල ළමය-න්ගේ නෙත් ද දැන් අප පන්තිය දෙසට ය.

මා ගුරුතුමිය ළඟට යනවිට ම මෙන් ''ඒ'' පන්තියේ ජිනදාස ද හයියෙන් කෙඳිරි ගාන්නට විය. දැන් ඔහුට ද මගේ ලෙඩේ ම බෝ වී ඇත. පන්ති දෙකේ ලෙඩුන් දෙදෙනා ම ප්‍රධානාචාර්ය තුමාගේ කාර්යාලයට ගෙන ගියේ අප දෙදෙනාගේ ම ඇඬුම් මධ්‍යයේ ය.

''මොකද මේ දෙන්න ගහගත්තද? මුල්ගුරු, ජයවර්ධන මහතා ඇසුවේ වේවැල අතට ගෙන සැරෙනි.

''නෑ සර්, මේ ගොල්ලන්ගෙ බඩ රිදෙනවලු.''

අප සමග ගිය ළමයින් හතර දෙනා ම එක විට ම වගේ කීවෝ ය.

''දෙන්නගෙ ම?''

''මොනවද දෙන්නම කෑවෙ.? හොරෙන්? මැංගුස් ගැට කෑවද?'' මුල්ගුරුතුමාට එක විට ම වත්ත පහළ ඇති මැංගුස් ගස් දෙක සිහි වන්නට ඇත.

''කියනව කියනව. බඩ ගිනිද? ගෙදරින් එනකොට කාල ආවෙ මොනවද? මොකද බඩ රිදෙන්නෙ?'' ප්‍රශ්න වැලකි.

''මොනවද සාක්කුවෙ?'' ජිනදාසගේ කොට කලිසම් සාක්කු දෙක ම පිම්බී තිබෙනු දැක මුල්ගුරුතුමා ඇසුවේ ය.

ජිනදාස ද කතාවක් නැත. ඔහු බියපත් මුහුණින් නාස් පුඩු දෙකෙන් ගලා එන හොටු වැල් උඩට අදිමින් කෙඳිරිගායි.

''කෝ බලන්න කියමින් මුල්ගුරු තුමා ජිනදාස ළඟට ඇදගෙන කලිසම් සාක්කුවකට ඇඟිලි දෙකක් දමා බලා එහි තිබුණු දෙල් ඇටවලින් කීපයක් එළියට ගත්තේ ය.

''මේවද කෑවෙ? දෙන්නම මේව අමුවෙන් කෑව නේද? හොඳ වැඩේ, බඩ රිදිල මදි බඩ පැලෙන්න ඕන. ජරාව කනවට'' කියමින් අප දෙදෙනා බංකුවක වාඩි කර වී ය.

''හ්ම්, කියන්නෑ, කුණු ජරාව කනව. අන්තිමේ බඩේ අමාරු හදාගන්නවා'' කියමින් ම කලිසම් සාක්කුවට අත දැමූ ඔහු රුපියලක කොළයක්  ගෙන ළමයකුට දී අසමෝදගම් බෝතලයක් ගෙන එන ලෙස පැවසුවේ ය.

සිංහල මිස්, අප පන්තියේ ගුරුතුමී, ''ඒ'' පන්තියේ යූ. එච්. ද සිල්වා මහතා සමග පැමිණ කෙඳිරිගාමින් සිටින අප දෙදෙනා දෙස බලන අතර සිදුවී ඇති සිද්ධිය ලොකු මහතා ඔවුනට පැවසුවේ අප දෙස ද බලමින්, සිනහවෙමින් සහ රවමින් ය.

''මේ ළමයා ''බී'' පන්තියෙ හොඳ ළමයෙක් නේද මිස්?'' යූ. එච්. සිල්වා මහතා පැවසූ අතර ''ඕ... ඔහෝ මේ අර ඉංග්‍රීසි පාඩම හොඳට කියපු ළමයා නේද? මොකක්ද කිව්වෙ නම?'' ලොකු මහත්තයා ඇසුවේ ය.

වැඩි වේලාවක් යාමට පෙර ගෙන ආ අසමෝදගම් බෝතලයෙන් ටික ටික අපට බොන්නට දීමෙන් අනතුරුව  ගෙදර යන ලෙස පැවසුවේ ලොකු මහතා ය. අපි දෙදෙනා වෙල මැදින්, නයි කොරනේලිස් අයියලාගේ ගෙය අසලින්, තිනියගොඩැල්ල පන්සල පිටුපසින් ගොස් පොලීසිය ළඟින් තාර පාරට ගොඩ වී ගෙදර ගියෙමු.

මෙයින් පසු පංතියේ ළමයින් අතර ජිනදාස ''දෙල්ඇටයා'' වූ අතර මම ''බඩයා'' වීමි.

**මතු සම්බන්ධයි**